بِسْمِ اللهِ الرَّحْمٰنِ الرَّحِيمِ

﴿وَعَدَ ٱللَّهُ ٱلَّذِينَ ءَامَنُواْ مِنكُمْ وَعَمِلُواْ ٱلصَّٰلِحَٰتِ لَيَسْتَخْلِفَنَّهُمْ فِى ٱلْأَرْضِ كَمَا ٱسْتَخْلَفَ ٱلَّذِينَ مِن قَبْلِهِمْ وَلَيُمَكِّنَنَّ لَهُمْ دِينَهُمُ ٱلَّذِى ٱرْتَضَىٰ لَهُمْ وَلَيُبَدِّلَنَّهُم مِّنۢ بَعْدِ خَوْفِهِمْ أَمْنًا ۚ يَعْبُدُونَنِى لَا يُشْرِكُونَ بِى شَيْـًٔا ۚ وَمَن كَفَرَ بَعْدَ ذَٰلِكَ فَأُوْلَٰٓئِكَ هُمُ ٱلْفَٰسِقُونَ﴾

මධ්‍යම මාධ්‍ය කාර්යාලය

Hizb ut Tahrir

නිකුත් කළ අංකය: හිජ්රි **1442/017** | **10** ජුමාදා/සිකුරාදා | ක්‍රි.ව. **25/12/2020**


# <u>මාධ්‍ය නිවේදනය</u>

**හිස්බු-ත්-තහ්රීර් හි මධ්‍යම මාධ්‍ය කාර්යාලයේ කාන්තා අංශයෙන් "ශ්‍රී ලංකා මුස්ලිම් ජාතීන් ජීවිතයෙත් හා මරණයෙත් මාරාන්තික දුක් විඳීම!" නමින් ජාත්‍යන්තර ව්‍යාපාර මාලාවක් දියත් කර ඇත.**

හිස්බු-ත්-තහ්රීර් හි මධ්‍යම මාධ්‍ය කාර්යාලයේ කාන්තා අංශයෙන්, ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් මුහුණ දෙන බරපතළ අසාධාරණයන් සහ අපයෝජනයන් පිළිබඳව ගෝලීය දැනුවත් කිරීම සඳහා ජාත්‍යන්තර ව්‍යාපාරයක් දියත් කරන බව නිවේදනය කරන අතර, ශ්‍රී ලංකා රජය විසින් අනිවාර්ය කළ කොවිඩ්-19 මුස්ලිම් මරණ මෘතදේහයන් ආදානය කිරීමේ නින්දිත ප්‍රතිපත්තිය අවසන් කරන ලෙස අපි ඉල්ලා සිටිමු. මෙම වසරේ අප්‍රේල් මස සිට කොරොනා වයිරසය ආසාදනය වී මරණයට පත් වූ මුස්ලිම්වරුන් විශාල ප්‍රමාණයක් භූමිදානය කිරීම වෙනුවට ආදාහනය කර ඇත්තේ ඔවුන්ගේ ඉස්ලාමීය විශ්වාසයන් උල්ලංඝනය කරමිනි. ඇත්ත වශයෙන් කියතොත් ආදාහනය කරන ලද සමහර මුස්ලිම්වරුන් කොවිඩ්-19 සදහා කිසිදු පරීක්ෂණයට ලක් කර නොමැති මෙන්ම පරීක්ෂණ වලින් අසාදිතයන් යැයි තහවුරු වුණේ ද නැත. දෙසැම්බර් මස 9 වන දින, දින 20ක් වයසැති මුස්ලිම් ළදරුවකු මියයාමෙන් පසුව කරන ලද කොවිඩ්-19 පරීක්ෂණයේ කොවිඩ් පොසිටිව් යයි කියමින් දෙමාපියන්ගේ අවසරයකින් තොරව බලහත්කාරයෙන් ආදාහනය කර ඇත. ආදාහනය කිරීමේ ප්‍රතිපත්තියට අභියෝග කරමින් මුස්ලිම් සහ ක්‍රිස්තියානුවන් සහ සිවිල් සමාජය විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම් 12 ක් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙසැම්බර් 1 වන දින ඉවත දමා ඔවුන්ගේ නඩු වලට ඇහුම් කන් දීමට ප්‍රතික්ෂේප කිරීම,එසේම ඔවුන්ගේ නඩු වල් අවලංගු කිරීම සඳහා කිසිදු හේතුවක් වත් නොදීම තුලින් පිලිබිඹු වෙන්නේ ලෞකික (secular) ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය යටතේ ඔවුන්ට වුණ අසාධාරණයට හා අයුක්තියට එරෙහිව නැගීසිටීමට කෙතරම් බල රහිතද යන්නයි. ශ්‍රී ලංකාවේ වාර්ගික මනසක් ඇති බෞද්ධ ජාතිකවාදි තන්ත්‍රය කොවිඩ් ප්‍රතිපත්තිය නිකුත් කලේ, මුස්ලිම් සමාජය මෘතදේහයන් අදාහනයට කිසිසේත්ම එකගත්වය පල නොකරන බව දැන දැනමය. කොවිඩ්-19 ගොදුරු වී මිය ගිය මෘතදේහ මහජන සෞඛ්‍යයට කිසිදු අනතුරක් නොමැතිව ආරක්ෂිතව භූමිදානය කලහැකි බව ප්‍රකාශ කල සුප්‍රසිද්ධ ජාත්‍යන්තර වෛරස් හා වසංගත රෝග විශේෂඥයින්ගේ මෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් ද ඔවුන් නොසලකා හැර තිබේ. එබැවින් පැහැදිලිවම මෙය මුස්ලිම් සමාජයට එරෙහිව ඔවුන්ගේ සංවේදීතාවයන්ට හානි කිරිමෙහිලා ක්‍රියත්මක කරනලද ඉස්ලාම් භීතික ප්‍රතිපත්තියක් බව මනාවට තේරුම් ගත හැක. ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකා රජය මෙම වසංගතය, සමාජයේ මුස්ලිම් විරොදි බෞද්ධ ජාතිකවාදි කොටස්වලින් තම පාලනයට තවදුරටත් සහයොහය ලබා ගැනීමට මෙන්ම රට තුල තමන්ගේම ඉස්ලාම් විරොදි න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාමට යොදා ගනී.

බොදුබල සේනා, බෞද්ධ ශක්ති බලකාය වැනි කණ්ඩායම් වල ආභාසය ලත් අන්තවාදී බෞද්ධ භික්ෂූන් ද ඇතුලුව රට තුල ඇති කරන ලද අන්තවාදී බෞද්ධ ජාතිවාදයේ නැගීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් වසර ගණනාවක් තිස්සේ අසාධාරණයන්ට හා ප්‍රචණ්ඩත්වයන්ට මුහුන දෙමින් සිටිති. ඇත්ත වශයෙන්ම, මේ වනවිටත් රොහින්ග්‍යා මුස්ලිම්වරුන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක කළ මියන්මාරයේ මුස්ලිම් විරොදි '969 ව්‍යාපාරය' සහ බොදු බල සේනා සංවිධානය අතර ඉස්ලාමීය විරොදි ගිවිසුමක් ස්ථාපිත කර ඇත. කලාපයේ මුස්ලිම්වරුන්ට සහ ඉස්ලාමයට එරෙහිව අනෙකුත් බෞද්ධ කණ්ඩායම් පෙල ගැස්වීමට සන්ධානයක් ඇති කිරීමට සංවිධාන දෙකම ප්‍රතිඥා දී තිබේ. මෑත වසරවලදී මුස්ලිම්වරුන් සියලු ආකාරයේ අපයෝජනයන් ලක්ව තිබේ. හිජාබ් පැලද සිටින මුස්ලිම් කාන්තාවන්ට හිරිහැර කර ඇති අතර ඇතැම් සාප්පු, රජයේ ගොඩනැගිලි ,පාසල් සහ රෝහල් වලට ඇතුලු වනවිට ඉස්ලාමීය ඇදුම ඉවත්කරන ලෙස බල කර ඇත. මුස්ලිම් ප්‍රජාව මත නිකාබ් තහනමක් පැනවීම, මුස්ලිම් ව්‍යාපාර වර්ජනය කිරීමට උසිගැන්වීම, ආහාර නිෂ්පාදනයෙන් හලාල් ලේබලය ඉවත් කිරීම, මුස්ලිම්වරුන් අත්තනොමතික ලෙස අත්අඩංගුවට ගැනීම සහ අනවශ්‍ය ලෙස මුස්ලිම් නිවෙස්වලට අතුලු වී සෙවීම් සිදු කිරීම උදාහරන කිහිපයකි. මුස්ලිම් සාප්පු, මුස්ලිම් නිවාස සහ මුස්ලිම් පල්ලිවලට බියජනක මැර ප්‍රහාර එල්ල වී තිබේ. දැන්, මේ සියල්ලටම අමතරව මුස්ලිම්වරුන්ට තම ආදරණීයයන්ගෙ අවසාන ආගමික වත්පිලිවෙත් පවා සිදු කිරීමට නොහැකිව ගෞරවාන්විත මරණයක අයිතියද අහිමි වීමේ වේදනාවෙන් පසුවෙති.

අපේක්ෂා කල පරිදි, ගොලීය වශයෙන් පීඩිත මුස්ලිම්වරුන් අතහැර දැමීමේ සිරිතට අනුකූලව, මුස්ලිම් රටවල පාලන තන්ත්‍රයන් ඇතුලු ලොක ආණ්ඩු ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ සහයට පැමිණීමට අපොහොසත් වී තිබේ. කෙසේ වෙතත්, ඉස්ලාමීය උම්මත් වන අපි කිසි විටකවත් ශ්‍රී ලංකාවේ සිටින අපගේ මුස්ලිම් සහොදර සහොදරියන් අත් නොහරිමු. හිස්බු-ත්-තහ්රීර් හි අපි ඔවුන්ට සහයොගය දක්වමින් සහ ඔවුන් විඳින බරපතළ අසාධාරණයන්ට එරෙහිව ගොලීය හඬක් නගන්නෙමු. එමගින් පීඩිතයින්ට අභය ලබා දෙන අතර මුස්ලිම්වරුන් ජීවත් වන ස්ථානය කුමක් වුවත් ඔවුන්ගේ අයිතිවාසිකම් සහ ආගම ආරක්ෂා කිරීම සඳහා; ඔවුන්ගේ භාරකරු, පලිහ සහ ආරක්ෂකයා වන, සර්වබලධාරි අල්ලාහ් ගේ ක්‍රමය වූ ඉස්ලාමීය කිලාෆතය, මුහම්මද් (සල්) තුමාගේ මගපෙන්වීම් අනුව නැවත ස්ථාපිත කිරීම සඳහා අපගේ සියලු උත්සාහයන් සමඟ අපි කටයුතු කරන්නෙමු, යුක්තිය වෙනුවෙන් පෙනී සිටින සියලු දෙනා මෙම වැදගත් ව්‍යාපාරයට සහාය දෙන ලෙස අපි ඉල්ලා සිටිමු.

සර්වබලධාරි අල්ලාහ් අල්-කුරාණයේ පවසයි: **وَإِنِ اسْتَنصَرُوكُمْ فِي الدِّينِ فَعَلَيْكُمُ النَّصْرُ "තවද ආගමික කටයුතුවලදී ඔවුන් ඔබෙන් උදව් ඉල්ලුවොත් උපකාර කිරීම ඔබේ යුතුකමයි" (අල්-අන්ෆාල් 8:72)**

මෙම ව්‍යාපාරය අනුගමනය කිරීම සඳහා :
http://www.hizb-ut-tahrir.info/en/index.php/hizbuttahrir/20600.html
**Facebook page: Women's Section CMO – HT**


Dr. නස්රීන් නවාස්
අධ්‍යක්ෂවරිය - කාන්තා අංශය
මධ්‍යම මාධ්‍ය කාර්යාලය
හිස්බු-ත්-තහ්රීර්